ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා
ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

# ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

ඊමේල් : info@cida.gov.lk        වෙබ් අඩවිය : www.cida.gov.lk

# පුරප්පාඩු

**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) පහත සඳහන් තනතුරුවලට අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.**

## 01. අධ්‍යක්ෂ ජනරාල් - (ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා කාණ්ඩය) - HM 2 - 1 (තනතුරු 01)

**සුදුසුකම් සහ සේවා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාවේ දී, ඉංජිනේරු විද්‍යාව/ වාස්තු විද්‍යාව / ප්‍රමාණ සමීක්ෂණ විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම

සමඟ

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) / ශ්‍රී ලංකා වාස්තුවිද්‍යා ආයතනය (SLIA) / ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂණ ආයතනය (IQSSL) විසින් පිළිගත් අදාල ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

සහ

අදාල ක්ෂේත්‍රයේ පලමු උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක/ රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ සංස්ථාවක/ රජයේ පිළිගත් ආයතනයක හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පිළිගත හැකි පුද්ගලික අංශයේ ආයතනයක අදාල ක්ෂේත්‍රයේ ප්‍රධාන ඉදිකිරීම් කටයුතු වල සියලුම පුළුල් ක්ෂේත්‍රවල "කළමනාකරණ මට්ටමක" වසර 20 ක අවම පලපුරුද්දක් ලබා තිබීම සහ ඉන් වසර 05 ක් ජ්‍යේෂ්ඨ කළමනාකරණ මට්ටමේ සේවා පලපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉංජිනේරු විද්‍යාව/ වාස්තු විද්‍යාව/ ප්‍රමාණ සමීක්ෂණ විද්‍යාවේදී උපාධිය සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL)/ ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනය (SLIA)/ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂණ ආයතනය (IQSSL) විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

සමඟ

(අ) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (HM) සේවා කාණ්ඩයේ අවම වශයෙන් වසර 07 සේවා පලපුරුද්දක් ලබා තිබීම.

සහ

(ආ) බහුවිධ විෂයන්ගෙන් යුත් කණ්ඩායම්වලට නායකත්වය ලබා දීම සහ මඟ පෙන්වීමට හැකිවීම, මානව සම්පත සහ වෙනත් සම්පත් නිසිලෙස යෙදවීමේ සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීමේ හැකියාව පළපුරුද්ද.

- **වයස** : වයස අවුරුදු 35 ට නොඅඩු සහ 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට සහ රාජ්‍ය/ අර්ධ රාජ්‍ය/ අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- **වැටුප් පරිමාණය :** HM 2-1 රු. 93,020/- 12 x 2,700/- 125,420/-

## 02. අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) - HM 1-3 - (තනතුරු 01)

**සුදුසුකම් සහ සේවා පළපුරුද්ද :**

**බාහිර අයම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබාතිබීම.

සමඟ

මානව සම්පත් කළමනාකරණය/ රාජ්‍ය කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ සාමාන්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ රාජ්‍ය ආයතනයක හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පිළිගත හැකි පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරු සේවා කාණ්ඩයේ (MM) I වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර 5 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

- **වැටුප් පරිමාණය** : HM 1-3 රු. 86,865/ - 15 x 2,270/- 120,915/-
- **වයස** : වයස අවුරුදු 35 ට නොඅඩු සහ 55 ට නොවැඩි විය යුතු ය.

  අභ්‍යන්තර අයදුම්කරුවන්ට සහ රාජ්‍ය/සංස්ථා අංශයේ අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

=== ========================== ======================

- **පත්වීමේ ස්වභාවය :**

  සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) සඳහා හිමිකම් ඇති ස්ථිර පත්වීමකි.

**සෑම අයදුම්කරුවෙකුම,**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

II. තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.

III. විශිෂ්ට චරිතයකින් හා ජවයකින් යුක්ත විය යුතුය.

- **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

  සම්මුඛ පරීක්ෂණය සඳහා වෙන් කළ ලකුණු පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| ■ අදාළ අමතර පළපුරුද්ද | - | ලකුණු 30 |
| ■ අදාළ අමතර අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් | - | ලකුණු 30 |
| ■ වෙනත් ජයග්‍රහණ | - | ලකුණු 15 |
| ■ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | - | ලකුණු 25 |
| | | ලකුණු 100 |

පත්වීම හුදෙක්ම ලබා දෙනුයේ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා අනුපිළිවෙළ අනුව ය.

- **වෙනත් ප්‍රතිලාභ**
  - රජයේ අනුමත දීමනා.
  - CIDA විසින් සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) වෙත වැටුපෙන් 15% හා 3% ක් දායක කරනු ඇති අතර සේවකයා විසින් වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට බැර කරනු ඇත.
  - ප්‍රසාද දීමනා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුව ලබා දෙනු ඇත.
  - වෛද්‍ය රක්ෂණාවරණ පහසුකම්.
  - රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලට අනුව ප්‍රවාහන පහසුකම්/ දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණය සිදු කෙරෙනු ඇත.

අධ්‍යාපන, වෘත්තීය සහ පළපුරුද්දට අදාළ සහතිකවල සහතික කළ පිටපත් සමග අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **2021.04.21** දින හෝ දිනට පෙර ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සභාපති වෙත එවිය යුතු ය. රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල සේවකයන් / ආයතනයේ ස්ථිර සේවකයන් තම අයදුම්පත්‍ර අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතු අතර තෝරාගනු ලැබුවහොත් අදාළ තනතුරින් මුදා හැරිය හැකි බව දැක්විය යුතු ය. අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ දැක්විය යුතුය.

අදාළ සියලු තොරතුරු ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියේ ඇත **www.cida.gov.lk**

**නිසිලෙස සම්පූර්ණ නොකරනලද / ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කෙටි ලැයිස්තුගත කරන ලද සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.**

**සභාපති**
**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**
**"සව්සිරිපාය" 123, විජේරාම මාවත,**
**කොළඹ 07**

Source: Dinamina, Daily News (2021.04.05)